# බුදු දහමේ ජාත්‍යන්තර ව්‍යාප්තිය උදෙසා ශ්‍රී ලාංකේය දායකත්වය

බුදු සමයේ ආරම්භය මුල්කාලීන ව්‍යාප්තිය හා එහි මධ්‍යතන යුගයේ දේශාන්තර ව්‍යාප්තිය පිළිබඳව සංක්ෂිප්ත වශයෙන් වුව ද අවබෝධ කර ගැනීම මෑතකාලීන බුදුසමයේ ජාත්‍යන්තර ව්‍යාප්තිය අධ්‍යයනය කිරීමේ දි මහඟු පිටුවහලක් සැපයෙන බව පැවසිය යුතුය. 19 වන සියවසේ ශ්‍රී ලාංකේය ජාතික හා බෞද්ධ පුනරුදයේ හා තවත් බොහෝ හේතු සාධක මත බුදුසමය බටහිරට ප්‍රචලිත වන ආකාරය පිළිබඳ පරීක්ෂා කර බැලීම මෙම ලිපියේ මුඛ්‍යාර්ථය වුවත් බුදු සමය දේශාටනකරණයේ ඓතිහාසික පසුබිම මදක් විමර්ශනය කර බැලීම වඩාත් ප්‍රයෝජනවත් වේ. මහාවග්ගපාලිය වාර්තා කරන අන්දමට බුදුදහම මුලින්ම අවබෝධ කර ගනු ලබනුයේ පඤ්ච වග්ගිය භික්ෂූන් වහන්සේලා විසින්ය. ඉන්පසු බහුජන හිතසුව පිණිස ප්‍රථම ධර්ම දූත කණ්ඩායම ගම් නියම් දනව් සිසාරා ධර්ම ප්‍රචාරය කිරීමෙන් බුදු දහම ව්‍යාප්ත කරවීමේ මුල්ම පියවර තබන ලදි. ඉන්පසු බුදු රජාණන් වහන්සේ ද උරුවෙල් දනව්වට වැඩමවා උරුවෙල කාශ්‍යප, ගයා කාශ්‍යප, නදී කාශ්‍යප යන තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් පිරිස දමනය කොට පැවිදි කරවා ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර යැවූහ. මුල්කාලීන ධර්මදූතයන් වහන්සේලාගේ අප්‍රතිහත ධෛර්යය, වාග් චාතුර්යය හා අපරිමිත කුශලතාව නිසාම ගිහි පැවිදි විශාල පිරිසක් මෙම නව දහම වැළඳ ගත්හ. රාජරාජ මහා මාත්‍යයන් පමණක් නොව ගොවි කම්කරු ආදී සාමාන්‍ය ජනතාව ද විශාල වශයෙන් මෙම නවඹු දර්ශනය හා ප්‍රතිපදාවෙහි අනුගාමිකයෝ වූහ. ගිහි ජනතාව බහුල වශයෙන් බෞද්ධ අනුගාමිකයන් වීම ශාසන ඉතිහාසයේ සුවිශේෂී සංසිද්ධියක් වශයෙන් පෙන්වා දිය හැකිය. එනම් මෙතෙක් නිර්වාණය ඒකායන අරමුණ කරගත් පැවිදි පිරිසකට පමණක් සීමා වී තිබුණු ශාසනය මෙලොව පරලොව උභයාර්ථ සාධනය අරමුණු කරගත් ගිහි පිරිසට ද ගැලපෙන සේ බෞද්ධ චින්තනය සකස් කර ගැනීමයි. ඒ අනුව සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, පරාභව, පත්තකම්ම යනාදී සූත්‍ර සිය ගණනක් බුදු හිමියන් විසින් දේශනා කරනු ලබනුයේ මෙම නව ශාසනික ප්‍රවණතාව නිසාම ය.

මෙම දේශනාවල මුඛ්‍යාර්ථය වන්නේ ආධ්‍යාත්මික පසුබිමක් මත භෞතික ජීවිතය සඵල කර ගැනීමයි. මේ නිසාම පැවිද්දන්ගේ නිර්වාණගාමී ප්‍රතිපදාව වෙනුවට ගිහියන්ගේ ස්වර්ගගාමී නව ප්‍රතිපදාවක් ඉස්මත්තට පැමිණේ. මෙය බුදු සමය තුළ සිදු වූ ඓතිහාසික පෙරළියක් වශයෙන් පෙන්වා දිය හැකි අතර එය බුදු සමය ජනතාකරණය වූ අවස්ථාවක් වශයෙන් ද දැක්විය හැකිය.

බුද්ධ කාලීන බුදු සමය කොතරම් ජනප්‍රිය, ආකර්ෂණීය ඉගැන්වීමක් වශයෙන් ප්‍රචලිත වුවත් එය භාරතීය මධ්‍ය දේශයෙන් බැහැරට ව්‍යාප්ත වූ බවට ඓතිහාසික සාධක නොමැති බව සාමාන්‍ය පිළිගැනීමයි. එම නිගමනය එළඹිය හැක්කේ ත්‍රිපිටකාගත ආරාම, නගර, රජ සිටු ආදී පුද්ගල නාමාදිය මෙන්ම බුද්ධ චරිතය සම්බන්ධ තොරතුරු හුදෙක්ම ඉන්දිය මධ්‍ය දේශය හා සම්බන්ධ වීමයි. මේ සඳහා තවත් ප්‍රබලතම සාධකයක් වශයෙන් දීඝනිකායේ

ජනවසභ සූත්‍රය පෙන්වා දිය හැකිය. එහි විවිධ ජනපදවලින් මිය ගිය අය ගැන කියැවෙන අතර එම පුද්ගලයන් අයත් වන ජනපද දහතුනම (13) අයත් වන්නේ භාරතීය මධ්‍ය දේශයටයි. ක්‍රි:ව 5 ශත වර්ෂයේ ශ්‍රී ලංකාවේ රචිත මහාවංශය වැනි ග්‍රන්ථ තුළ බුදු රජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වූ බව වාර්තා වුවත් ඒ සම්බන්ධව කිසිදු සටහනක් මුල් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ තුළ දැකිය නොහැකිය. ඒ අනුව භාරතයේ මධ්‍ය දේශයට පමණක් සීමා වී තිබුණු බුදු සමය ජාත්‍යන්තර රාජ්‍යන්ට දායාද කර දෙනුයේ ධර්මාශෝක මහාධිරාජයා විසින්ය. ක්‍රි:පූ: 3 වන සියවසේ තෙවන සංගායනාවෙන් පසු මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන්ගේ උපදේශකත්වයෙන් සිදු වූ මෙම මහඟු ඓතිහාසික ශාසනික කර්තව්‍යය බුදු දහම ජාත්‍යන්තරකරණයේ මුල්ම පියවර වශයෙන් පෙන්වා දිය හැකිය. භාරතය තුළත් ඉන් බැහැරත් වූ ප්‍රාදේශීය හා රාජ්‍යයන් 9කට ධර්මදූත කණ්ඩායම් පිටත් කර යැවීමෙන් වර්තමානයේ පවා ලංකාව, තායිලන්තය, බුරුමය, ලාඕස්, කාම්බෝජ යන රටවල් ථේරවාද බුදු සමයේ මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කරන ආකාරය ප්‍රශංසනීයයි.

බුදු දහම හා ජාත්‍යන්තර සම්බන්ධතාව ගවේෂණය කිරීමේ දී මීළඟට වැදගත් වනුයේ ක්‍රි:පූ: ප්‍රථම ශත වර්ෂයේ පශ්චාත් භාගයේ හෝ ක්‍රි:ව: මුල් භාගයේ දී පමණ බුදු සමය මධ්‍යාසියාව හරහා චීනය, කොරියාව හා ජපානය යන රටවල්වලට පැතිරී යාමයි.

මෙකී නැගෙනහිර ආසියානු රටවල්වල ව්‍යාප්ත වන්නේ ක්‍රි:ව: 1 වන සියවසේ කණිෂ්ක අධිරාජයා විසින් සිව්වන සංගායනාවෙන් පසු සර්වාස්තිවාද, සෞත්‍රාන්තික, මධ්‍යමක හා යෝගාවචාර වශයෙන් ප්‍රධාන සම්ප්‍රදාය හතරකට ගොනු කරගන්නා ලද බෞද්ධ ඉගැන්වීම්ය. හීනයාන-මහායාන සම්ප්‍රදායන් දෙකටම අයත් ඉගැන්වීම් මධ්‍ය ආසියාව හරහා චීනයට ව්‍යාප්තව ගියත් චීනයේ වඩාත් ජනප්‍රියත්වයට පත් වන්නේ මහායාන ඉගැන්වීම් වීම සුවිශේෂී ලක්ෂණයක් වන අතර ඊට බල පෑ හේතු සාධක විශාල පර්යේෂණයකට උපස්ථම්භක වනු නොඅනුමානය. සමහර විට හීනයානයට වඩා මහායානය දාර්ශනික හා ආගමික අංශයන්ගෙන් වඩාත් පරිපෝෂිත ඉගැන්වීමක් නිසා එය චීනය තුළ වඩාත් ජනප්‍රිය වන්නට ඇතැයි කල්පනා කළ හැකිය. ක්‍රි:ව: 5 පමණ කොරියාව ද ජපානයට දායද කරනු ලබනුයේ චීනයේ සකස් වෙන මහායාන බුදුදහමයි. ක්‍රි:ව: 7 වන සියවස පමණ ටිබෙට් දේශයට බුදු දහම ව්‍යාප්ත වීමත්[9] සමගම ආසියානු මහාද්වීපයේ විශාල ප්‍රදේශයක් බුදු දහම උරුම කරගන්නා බව ප්‍රකාශ කළ හැකිය. බුදු දහම ව්‍යාප්ත වූ සෑම ප්‍රදේශයක දීම බුදු දහම හා දේශීය ආගම් අතර සිදු වූ ඝට්ටනය හා සම්මිශ්‍රණය සුළුපටු නොවේ. බුදු දහම උපන් භාරතයේ දී කොතරම් හින්දු දහම සමග මිශ්‍රණය වුවා ද කිවහොත් එය හින්දු දහමේ ඒක දේශයක් බවට දිය වී ගියේය. අනෙක් අතට ක්‍රි:ව: 13 සියවසෙන් පසු ආසියාවට බලපාන මුස්ලිම් ආක්‍රමණ නිසා බුදු දහම භාරතයෙන් අන්තර්ධාන විය.

## බුදු සමයේ මෑතකාලීන ව්‍යාප්තිය

බුදු දහම කොතරම් සක්‍රිය හා ආකර්ෂණීය වුවත් එය සීමා වී තිබුණේ නැගෙනහිර ආසියාවට පමණි. බුදු දහම හා මුලින්ම සම්බන්ධතා ඇති කර ගත් මුල්ම බටහිර පිරිස වශයෙන් ග්‍රීකවරුන් පිළි ගැනේ. යුධකාමී මහා ඇලෙක්සැන්ඩර් රජතුමා නිසා ග්‍රීක සංස්කෘතිය ඉන්දියාවටත් එසේම ඉන්දියානු සංස්කෘතිය හා දර්ශනයන් බටහිර ලෝකයටත් පැතිරී යෑමට මං පෙත් විවර වූයේය.

යුද්ධය කොතරම් කුරිරු වුවත් සමහර විට ඉන් සිදුවන යහපත් ප්‍රතිඵල ද වේ. රජුන් විසින් රටවල් ආක්‍රමණය කළ පසු සංස්කෘතික හා දාර්ශනික චින්තාවන් අතර සිදුවන සම්මිශ්‍රණය නොවැළැක්විය හැකිය. එසේම මුහුදු වෙළඳුන් හා සංචාරකයන් විසින් ද විශාල සේවයක් බුදු දහම බටහිරට ව්‍යාප්ත වීම උදෙසා සිදු කළ බව පැවසිය හැකිය. මේ මාර්ගවලින් බෞද්ධ පුරාවෘත්ත ක්‍රිස්තියානි පුරාවෘත්ත සමග සම්මිශ්‍රණය වූ බව පිළිගැනේ. එනම් බර්ලාම් (Barlam) සහ ජෝසෆාන් (Josaphan) ගේ ක්‍රිස්තියානි පුරාවෘත්තය බෞද්ධ භගවාන් හා බෝධිසත්ත්ව පුරාවෘත්තයෙන් සකස් කර ගන්නා ලද්දකි. තවත්, එසේ ක්‍රිස්තියානි ශාන්තුවරුන් හා සම්බන්ධ කොට සංස්කරණය කරගත් පුරාවෘත්ත අතර හුබර්ටුස් (Hubertus) ජුලියානුස් (Julianus) යන ආගමික නායකයන් වැදගත් වේ. ක්‍රිස්තියානි දේවධර්මයට අනුව ක්‍රිස්තුන් වහන්සේ අසාමාන්‍ය දිව්‍යමය චරිතයකි. එසේ මූර්තිමත් කරගනු ලබනුයේ බෞද්ධ පතපොතේ එන නිග්‍රෝධමිග ජාතකයේ බලපෑමෙන් බව පැවසේ. මෙබඳු අපැහැදිලි හා එතරම් විශ්වාසනීත්වයක් නොමැති සාධක මත පදනම් ව බුදු දහම හා බටහිර ලෝක අතර සම්බන්ධතා පිළිබඳ පර්යේෂණ කොට කරුණු ඉදිරිපත් කළ දාර්ශනිකයන් වශයෙන් 18, 19 සියවස් තුළ විසූ ස්කොපෙන්හුර් (Schopenhur) සහ නීටාෂෙ (Nietzsche) පෙන්වා දිය හැකිය.

මෑත කාලීන බුදු සමය වශයෙන් සාමාන්‍යයෙන් අදහස් කරනු ලබන්නේ 18 වන සියවසේ අග භාගයෙන් පසු කාලයට අයත් බුදු දහමයි. විශේෂයෙන්ම 19 වන සියවසේ සිද්ධ වූ දේශපාලනික, ආර්ථික හා තාක්ෂණික පෙරළි නිසා බුදු දහම බටහිරට ව්‍යාප්ත වී ගිය ආකාරය මෙහිදි අවධාරණය කෙරේ. මීට ශතවර්ෂ දෙකහමාරකට පමණ පූර්වයේ දි බුදු දහම නූතන ලෝකයට ව්‍යාප්ත වීමට බල පෑ හේතු සාධක රාශියක් පෙන්වා දිය හැකිය. ඒවා මෙසේය.

i. බුදු දහම ඉගෙනීම සඳහා බටහිර උගතුන් තුළ ඇති වූ කැමැත්ත
ii. අනගාරික ධර්මපාලතුමා විසින් ආරම්භ කරන ලද ජාතික හා ආගමික ක්‍රියාකාරකම්
iii. බෞද්ධ ධර්මදූත ව්‍යාපාරයක් ආරම්භ වීම විශේෂයෙන්ම ශ්‍රීලාංකේය භික්ෂූන් වහන්සේලා විසින්

iv. බෞද්ධයන් බටහිරට විසිරී යෑම
v. ථෙරවාද මහායාන භේදය අමතක වීම
vi. විවිධ පාරිසරික හේතු කාරණා

අධිරාජ්‍යවාදී බටහිර ජාතීන් විසින් නැගෙනහිර ගොඩ නගන ලද කොලනි ක්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් බටහිර උගතුන්ට බෞද්ධ හා හින්දු පූජනීය ග්‍රන්ථ බටහිර භාෂාවන්ට පරිවර්තනය කිරීමට අවස්ථාව ලැබුණි. මුලදීම ඔවුන්ගේ අතට බහුල වශයෙන් පත් වූයේ සංස්කෘත හා ටිබෙට් බෞද්ධ ග්‍රන්ථයෝය. ඔවුන් අතර පැරණිම උගතෙක් වූ හන්ගේරියානු ජාතික කොස්මා ඩි කොරොස් (1784-1842) ගේ අවධානය යොමු වූයේ ටිබෙට් බෞද්ධ පතපොත කෙරෙහිය. එතුමා විසින් 1834 මුද්‍රණද්වාරයෙන් එළි දක්වන ලද ටිබෙට් ඉංග්‍රීසි ශබ්ද කෝෂය (Tibetan – English Dictionary) ටිබෙට් බෞද්ධ ග්‍රන්ථ අධ්‍යයනය ආරම්භ කිරීමට මහත් පිටු බලයක් වූයේය. එසේම ඉංග්‍රීසි ජාතික බී හොග්සන් සංස්කෘත ග්‍රන්ථ අධ්‍යයනයට යොමු වූ අතර එතුමා විසින් 1821-41 අතර නේපාලයෙන් සොයා ගෙන සකස් කරන ලද බෞද්ධ සංස්කෘත අත්පිටපත් සමුදාය ඉන්දියාවේ හා යුරෝපයේ පුස්තකාලවලට බෙදා හැරීම බටහිර උගුන් බෞද්ධ ග්‍රන්ථ අධ්‍යයනයට ආකර්ෂණය වීමට හේතු වූයේය. එබඳු තවත් ශ්‍රේෂ්ඨ බටහිර උගතුන් වශයෙන් මැක්ස් මුලර් (Max-Muller), එමිල් සෙනාර්ට් (Emile Senart), ලුවිස් ද ලා වැලේ පෞෂින් (Louis de la Vallee Poussin) සඳහන් කළ හැකි අතර ඔවුන්ගේ වැඩි අවධානය යොමු වූයේ සංස්කෘත භාෂාව හා මහායාන බෞද්ධ ග්‍රන්ථ උදෙසා ය.

යුරෝපයට පාලි යන පදය දැන ගැනීමට ලැබෙනුයේ අශෝක රජතුමාගේ ශිලා ලේඛනවලින් හමු වූ ‘පියදස්සි’ යන පදය පිළිබඳ පුරා විද්‍යාඥයන් විසින් පර්යේෂණ කිරීමට යෑමේ ප්‍රතිඵලයක් වශයෙනි. අශෝකගේ ශිලා ලේඛන සම්බන්ධ අධ්‍යයනයන්හි ප්‍රමුඛතාවය හිමි වූයේ පුරාවිද්‍යාඥ ජේම්ස් ප්‍රින්සෙප්ටය. ‘පියදස්සි’ යන පදය ගවේෂණය කිරීමට ලංකාවේ රචිත පාලි මහාවංශය මහඟු පිටුවහලක් වූයෙන් ඉහත කී පුරා විද්‍යාඥයින්ගේ අවධානය පාලි ග්‍රන්ථ කෙරෙහි යොමු වූයේය. පාලි සාහිත්‍යයේ වටිනාකම අවබෝධ කරගත් ජෝර්ජ් ටර්නර් (George Turnour) ඉංග්‍රීසි පරිවර්තනයක් සහිතව විවේචනාත්මක පාලි මහාවංශයක් 1837 දී මුද්‍රණද්වාරයෙන් එළි දැක්වූයේය.

1850 දී ස්පෙන්සර් හාර්ඩි (Spenser Hardy) විසින් ලියන ලද ‘Eastern Monarchism කෘතිය ද, 1853 දී රචිත ‘Manual of Buddhism කෘතිය ද එසේම පෞස්බෝල් (Faussboll) විසින් සකස් කරන ලද 1855 පාලි ධම්මපදයේ ලතින් පරිවර්තනයද ඔහුගේම 1877-1897 දී කාණ්ඩ 6 කින් සමන්විත ජාතක කථා සංග්‍රහයන් ද, ඔල්ඩර්න්බර්ග්ගේ විනය පිටක ග්‍රන්ථ ද බටහිර උගතුන්ගේ පාලි බෞද්ධ අධ්‍යයන ජාත්‍යන්තර තලයට ගෙන යෑමට හේතුකාරක වූ ප්‍රබලතම සාධකය වශයෙන් 1881

එංගලන්තයේ ලන්ඩන් නුවර ආරම්භ කරන ලද පාලි ටෙක්ස් සමාගම (Pali Texts Society) පෙන්වා දිය හැකිය.

### රිස් ඬේවිස් මහතා

රිස් ඬේවිස් මහතා 1864 ලංකාවට සිවිල් සේවය සඳහා පැමිණ පසුව විනිශ්වයකාරයකු වී ගාල්ලේ බෞද්ධ විහාරයක් සම්බන්ධයෙන් ඇති වූ විනය ගැටළුවක් නිසා එය නිරාකරණය ට පාලි භාෂා දැනුම අවශ්‍ය වූ බැවින් එම භාෂාව ඉගෙනීමට යොමු වූ කෙනෙකි. බෞද්ධ ශුද්ධ ග්‍රන්ථ තිබෙන්නේ පාලි භාෂාවෙන් බව දැනගත් ඔහු බෙන්තර යාත්‍රා මුල්ලේ ධම්මාරාම හිමියන්ගෙන් එය ඉගෙන ගත්තේය. 1881 පුරා විද්‍යා අධ්‍යක්ෂක ධූරයට පත් මෙතුමා අනුරාධපුරයෙන් බොහෝ තැන් සොයා ගත්තේය. 1872 ආපසු සිය රටට ගිය මෙතුමා 1875 රාජකීය ආසියාතික සමිතියේ සඟරාවෙහි “පරාක්‍රමබාහුගේ ශිලා ලිපි” “සීගිරි හෙවත් සිංහ පර්වතය” ආදි ලිපි පළ කළේය.

එතුමා ලක්දිවින් ගෙනා දීපවංශය මුද්‍රණය කරවීමට සිතමින් ඉන්නා විට ඉන්දියා ඔෆිස් කාර්යාලයේ විනය පිටකය මුද්‍රණය කිරීමට පිළියෙල කරමින් ඔල්ඩරින් බර්ග් මහතා එතුමා වෙත පැමිණ දීපවංශ මුද්‍රණය ගැන කථා කරන විට තමන් ඒ ගැන එකතු කළ කරුණු පෙන්නුවේය.

i. 1877 දී “ලක්දිව පුරාණ මැහුම් හා කාසි” (Ancient Coins and measures of Ceylon) පොත පළ කළේය.
ii. 1878 බුද්ධාගමේ සාරය උපුටා සකස් කළ “The Buddhism” නම් ග්‍රන්ථය මුද්‍රණය කළේය. මේ පොත කොතරම් ජනප්‍රිය වී ද යත් 1914 වන විට එය 23 වතාවක් මුද්‍රණය වී තිබේ. බුදු දහම සම්පූර්ණ විනාශයක් නොවේ යැයි යුරෝපය පුරා පළ කර හරින ලද්දේ මේ පොතිනි.
iii. පෙරදිග ශුද්ධ පොත් “Sacred Books of the East” යන පොත් පෙළේ 11 වන පොත වශයෙන් බෞද්ධ සූත්‍ර කිපයක පරිවර්තනයක් ද පළ කළේය.
iv. මෙසේ ක්‍රියා කරන අතර යුරෝපයේ නොයෙක් පුස්තකාලවල තැන්පත්ව තිබූ මුද්‍රණයට නොපැමිණි ත්‍රිපිටක පාලි පොත් මුද්‍රණය කිරීම සඳහා “The Pali Text Society” සමිතිය 1881 පිහිටු වීය. දැනට වසර 100කට ආසන්න කාලයක් පොත් මුද්‍රණය කිරීමේ නියැලුණු මෙම සමාගම ත්‍රිපිටක පොත් හා අටුවා ග්‍රන්ථ සිය ගණනක් මුද්‍රණය කර පළ කරවා තිබේ. සමහර පොත් පිටු 400-500 පමණය. එපමණක් නොව එම සමිතිය මගින් එම පොත්වල ඉංග්‍රීසි පරිවර්තනයන් ද සකස් කළේය.
v. මෙම සමිතියෙන් බිහිවුණු අග්‍රතම ඵලය නම් රිස් ඬේවිස් මහතා හා වෝඩ් විසින් සම්පාදිත පාලි-ඉංග්‍රීසි ශබ්ද කෝෂයයි.

vi. 1882 ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පාලි මහාචාර්යවරයා විය. මෙතුමා මිලින්ද ප්‍රශ්නය, දීඝ නිකාය, ඉංග්‍රීසියට නගා කොටස් වශයෙන් පළ කළේය.

vii. ඇමෙරිකාවට ගිය මේ මහතා හාර්වඩ් විශ්වවිද්‍යාලයේ "බෞද්ධාගම හා එහි ඉතිහාසය හා සාහිත්‍යය" යන මැයෙන් කථා පැවැත්වීය.

viii. ඉන්දියාව නැරඹීමට ගිය මෙතුමා 1902 "Buddhist India" නම් වටිනා ග්‍රන්ථයක් රචනා කළේය.

ix. 1908 "Early Buddhism" පොත පළ කළේය.

මෙසේ ලොව පුරා පාලි හා බෞද්ධ ග්‍රන්ථ සම්පාදනය කරමින් ද ඒ හා සම්බන්ධ දේශන පවත්වමින් ද තනතුරු ලබමින් ඒවායෙන් ද සේවය කරමින් මෙතුමා කළ අනල්ප සේවය කියා නිම කළ නොහැකිය. 1922 නියුමෝනියා අසනීපයෙන් අභාවප්‍රාප්ත විය.

සිවිල් සේවය සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රේෂ්ඨ විද්වතුන් වන බ්‍රිතාන්‍ය ජාතික රිස් ඩේවිස් පසුව එතුමාගේ බිරිඳ කැරලයින් රිස් ඩේවිස් මැතිණිය ද සම්බන්ධ වේ. ආරම්භ කරන ලද මෙම පාලි පොත් සමාගම මගින් සම්පූර්ණ පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසි බසින් සංස්කරණය කොට මුද්‍රණය කිරීම, යුරෝපය හා අවට පාලි බුදු දහම ව්‍යාප්තිය කරවීමෙහි ලා මහඟු සේවයක් සිදු කෙරිණි. 1864 ලංකාවට සිවිල් සේවය සඳහා පැමිණ පසුව විනිශ්වයකාරයෙකු වී ගාල්ලේ බෞද්ධ විහාරයක් සම්බන්ධයෙන් ඇති වූ විනය ගැටළුවක් නිසා එය නිරාකරණයට පාලි භාෂාව ඉගෙනීමට ඔහුට සිත් විය. බෞද්ධ ශුද්ධ ග්‍රන්ථ තිබෙන්නේ පාලි භාෂාවෙන් බව දැනගත් ඔහු බෙන්තර යාත්‍රාමුල්ලේ ධර්මාරාම හිමියන්ගෙන් එය ඉගෙන ගත්තේය. 1881 පුරාවිද්‍යා අධ්‍යක්ෂ ධුරයට පත් එතුමා අනුරාධපුර බොහෝ ඓතිහාසික තැන් සොයා ගත්තේය. 1872 ආපසු සිය රට වන මහා බ්‍රිතාන්‍යයට ගිය මෙතුමා 1875 රාජකීය ආසියාතික සඟරාවට 'පරාක්‍රමබාහුගේ ශිලා ලිපි', 'සීගිරි' හෙවත් 'සිංහ පර්වතය' ආදි ලිපි පළ කළේය.

## රිස් ඩේවිස් මැතිණිය

මෙතුමාගෙන් පසු ඔහුගේ බිරිය වන කැරොලයින් රිස් ඩේවිස් මැතිණිය ද පාලි භාෂා සාහිත්‍යයට මහඟු සේවයක් කළාය. ඇය බොහෝ කලක් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳව ආචාර්ය ධුරය දැරිය. සිය සැමියාගෙන් ඉගෙන ගත් ඇය පාලි හා බෞද්ධ පොතපත රචනා කළාය. ශුද්ධ කළාය.

| | | |
|---|---|---|
| I. | විභංග ප්පකරණය | II යමකප්පකරණය |
| III | දුක පට්ඨානය | IV යමක පට්ඨාන දෙකේ අටුවා |
| V. | විශුමග්ගය | VI පුග්ගල පඤ්ඤත්ති අටුවා |

යනාදි පොත් ශුද්ධ කළාය.

VII අභිධර්ම සංග්‍රහය VIIIධම්මසංගනිය

IX කථා වත්ථු යන අභිධර්ම පොත් ඉංග්‍රීසියට නගන ලදි.

බෞද්ධ චිත්ත ධර්මය ශාස්ත්‍රය සම්බන්ධ පොත් කීපයක් ද රචනා කළාය. ඒවා අතර "Outlines of Buddhism", "Gotama the Man" "The Sakya" යන පොත් වේ.

ඇය 1913 "Psalms of the Sisters" නමින් ථේරීගාථා ඉංග්‍රීසි බසට පරිවර්තනය කර අපූරු කෘතියක් නිර්මාණය කළාය.

1917 සංයුක්ත නිකායේ සගාථක වග්ගය රමණීය ලෙස ඉංග්‍රීසි බසට පෙරලිය

මෙම PTS ආයතනය නිසා බටහිර පාලි හා බෞද්ධ ධර්මය උගත් පඬිවරුන් රාශියක් පෙරට ආහ.
ඔවුන් අතර

| | |
|---|---|
| i. වී ට්‍රෙන්ක්නර් | ii.ආර් චාමර්ස් |
| iii. කේ ඊ නයුමාන් | iv.එන් එල් වුඩ්වර්ඩ් |
| v. ආර් මොරිස් | vi.ඊ හාඩි |
| vii .ශර්මන් ඔලිඩන් | viii.බර්ග්එව් කරින් |

එසේම ඇමෙරිකා උගතුන් වන

ix .වර්නන් x.බර්ලින්හෙම් ආදීන්ද වේ.

## විල්හෙල්ම් ගෛගර්

පෙරදිග භාෂාවන් පිළිබඳව ගැඹුරු දැනුමක් තිබුණු බැවේරියාවේ අගනුවර වූ මියුනික් විශ්ව විද්‍යාලයේ ඉන්දියානු පෙරදිග භාෂාවන් පිළිබඳ ආචාර්ය ධුරය දැරීය. ඉන් පාලි භාෂාවට හා සංස්කෘත භාෂාවට කරන ලද පර්යේෂණාත්මක සේවය අතිවිශාලය. සිංහල භාෂාව පිලිබඳව ද ගැඹුරු දැනුමක් විය. ද්‍රවිඩ බස ද දන්නේය. සිංහලයන්ගේ භාෂාව හා සාහිත්‍ය නම් පොතක් ද පළ කරවීය. (Singhalises Etymologie) සිංහල නිරුක්තිය පිළිබඳ ග්‍රන්ථයක් ද පළ කළේය. (Literature and sprache der Singhalese) සිංහල මහා ශබ්ද කෝෂයට උපදෙස් දීම ද මෙතුමා අතින් සිදු විය.

මෙතුමා විසින් රචිත පාලි ග්‍රන්ථ අතර

(i) මහාවංශ පෙළ ශුද්ධ කොට එංගලන්තයේ මුද්‍රණය කිරීම හා එය ඉංග්‍රීසියට නගා පළ කිරීම. (ii) දීපවංශ මහාවංශ යන පාලි පොත් දෙක ගැන විවේචනයක් ජර්මන් බසින් 1905 පළ කිරීම (iii) ශුද්ධ කරන ලද චූලවංශ පෙළ ද PTS මගින් පළ කරවීම. වැදගත් කෘති ලෙස සඳහන් කළ හැකිය.

## ඔලිඩර්න්බර්ග්

මෙතුමා විසින්, විනය පිටකයේ සංස්කරණයක් පළ කළේය. මෙම ග්‍රන්ථයේ හැඳින්වීමට බෞද්ධ විනය පිළිබඳ සාරගර්භ විස්තරයක් වන අතර බෞද්ධ භික්ෂුන් පිළිබඳ විස්තරයක් ද වන්නේය. විනය පිටකයේ ඉංග්‍රීසි පරිවර්තනය 1879-1883 අතර ප්‍රකාශයට පත් විය. රීස් ඩේවිස් මහතාගේ සහයෝගයෙන්

*පාතිමොක්ඛ *මහා වග්ග *චුල වග්ග ග්‍රන්ථවල ඉංග්‍රීසි පරිවර්තනයන් ද පළ කළේය.

මෙම පොත් "Sacred Books of the East" xiii,xvii සහ xx යන වෙළුම්හි ඇතුළත් වේ.

මෙතුමාගේ ප්‍රධාන කෘති වශයෙන්

- ථේර ථේරී ගාථා
- දීපවංශ
- Literature des alter Indian" දැක්විය හැකිය.

මේ හැරුණු විට වේදය හා පාලි සාහිත්‍ය අතර සම්බන්ධය දැක්වීමෙහි ලා ඔල්ඩන් බර්ග් විසින් ලියන ලද ලිපි හා දැනුම බොහෝය.

## එච්. කර්න්

මෙම යුගයේ කැපී පෙනෙන තවත් විද්වතකු නම් එච්. කර්න්ය. ඔහුගේ ප්‍රථම සංස්කරණය ජාතකමාලාවේ (වෙළුම් 1 H.O.S. 1981), මහායාන ධර්මය තේරුම් ගැනීමට උපකාරී වන සද්ධර්ම පුණ්ඩරිකා (Bibl. Buddhism 1908) පරිවර්තනය S.A.B.E. vol. xxi 1884), 1896 බුද්ධ ධර්ම සංග්‍රහය (Manual of Indian Buddhism බුදු දහමේ ඉතිහාසය හෙළි කරන සාරාංශයකි., Histore du Bouddhihme dans j' jude 1901) නම් කෘතිය බුද්ධ ධර්මය හා සංඝයා පිළිබඳව හා බුද්ධ චරිතය පිළිබඳ දීර්ඝ විස්තරයකි. නිකාය වර්ධනය ගැන තොරතුරු ද වේ.

## ෆ්‍රැන්ක් ලි වුඩ්වර්ඩ් (වනපාල)

එංගලන්තයේ නෝෆෝක් (Norfolk) ප්‍රාන්තයේ සහම්ටෝනි (Saham Toney) නම් ගම්මානයේ 1871 අප්‍රේල් 13 වෙනිදා උපත ලද වුඩ්වර්ඩ් මහතා 1893 කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් බටහිර සම්භාව්‍ය භාෂා පිළිබඳව දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් ලබා "Royal Grammar" පාසැලෙන් බටහිර සම්භාව්‍ය භාෂා පිළිබඳව ආචාර්යවරයකු වශයෙන් සේවය කළේය. ආගම ධර්මය හා දර්ශන විෂයට විශේෂ උනන්දුවක් දැක් වූ ඔහු වැදගත් ග්‍රන්ථයක් වූ රෝම අධිරාජ්‍ය '*මාර්කුස් අවුරේලියස්*' (Marcus Autrlius) ගේ භාවනා (Meditation) නම් ග්‍රන්ථය කියවීමෙන් අධ්‍යාත්ම ගුණධර්ම වගාව පිළිබඳව මහා අවබෝධයක් ලැබීය. සංගමයට බැඳුණු හේ ගාල්ලේ මහින්ද විද්‍යාලයේ විදුහල්පති වශයෙන් 1903 ලංකාවට පැමිණියේය. එකල මහින්දයේ ශිෂ්‍යයන් 89ක් හා ගුරුවරුන් 7ක් විය. එතුමා එය

ශිෂ්‍යයන් 142 වැඩ කළේය. එම පාසල් බුද්ධ ධර්මය, සිංහල, පාලි හා ලංකා ඉතිහාසය ඉගෙනීමට විධිවිධාන සැලසීය. මිෂනාරීන්ගේ අභිමතය පරිදි සැකසුණු අධ්‍යාපන විෂයමාලා එතුමා දේශීය බෞද්ධ ස්වරූපයට සකස් කළේය. පාසල ඇරඹුණේ පන්සිල් ගැනීමෙනි. ලැතින් උද්යෝග පාඨය වෙනස් කොට "ඛිප්පං වායාම පණ්ඩිතො භව" යන්න තෝරා ගැනිණි. එතුමා කොතරම් දේශීය ස්වරූපය අගය කළේද යත් සිය නම ද වෙනස් කොට වනපාල යන නාමය ගත්තේය.

බුදුදහම ඉගෙනීම් නම් පාලි භාෂාව දැනුම හා සිංහල හැදෑරිය යුතු වූයෙන් එතුමා ඒවා ඉගෙන කේම්බ්‍රිජ් සරසවිය මගින් පවත්වන විභාගවල ද විෂයයන් වශයෙන් පිළිගන්නා තත්වයට ක්‍රියා කළේය. The Buddhist නම් සඟරාවේ සංස්කාරක වශයෙන් මෙරටට විශාල සේවයක් කළ වනපාල මහතා එංගලන්තයේ PTS  සංගමයට ද තම පාලි භාෂා හා බෞද්ධ අධ්‍යයන දැනුම පරිත්‍යාග කිරීමට කල්පනා කොට එහි ගියේය. එහි Rowella නම් ගමේ පළතුරු වත්තක ඉතා අල්පේච්ඡ ජිවිතයක් ගත කරමින් එතුමා සම්පාදනය කළ කෘති රාශියකි. ඒවා PTS සමාගමෙන් මුද්‍රණය කර ප්‍රචාරය කළේය. එතුමා සතු සියලුම දේ අනුන්ට පරිත්‍යාග කළේය. අවසාන කාලයේ තමන්ගේ තත්වය ගැන "මම මගේ ආශ්‍රමයට වී සිටින තලගොයකු වැනි" යැයි පවසමින් ගාල්ලේ මහින්ද විද්‍යාලයේ සඟරාවකට ලිපියක් ද ඒවා තිබීමෙන් පෙනේ. 1952 මැයි මස අභාවප්‍රාප්ත විය.

එතුමා විසින් රචිත පොත් පත් වශයෙන්

1. The Buddha's Path of Virtue (ධම්ම පදයේ පරිවර්තයකි), 2. The book of Kindred sayings II

    සංයුක්ත නිකායේ දෙවෙනි වෙළුම
    සංයුක්ත නිකායේ තෙවෙනි වෙළුම පරිවර්තනය
    සංයුක්ත නිකායේ සිව්වැනි වෙළුම පරිවර්තනය
    සංයුක්ත නිකායේ පස්වෙනි වෙළුම පරිවර්තනය

    දැක්වීමට පුළුවන.

එසේම

3. Saratthappakasanie (සංයුක්ත නිකායේ කථා සංස්කරණය)
4. Some Sayings of the Buddha:විනය පිටකය, ධම්මපද ඉතිඋත්තක,උදාන සුත්ත නිපාත සහ දිය. මජ්ඣිම, සංයුක්ත , අංගුත්තර සහ ඛුද්දක නිකාය ග්‍රන්ථවලින් උපුටා ගත් පාඨවල පරිවර්තනය සහිත කෘතියකි.
5. Anguttara Nikaya (E M Hare)
   මෙහි අට්ඨකථා ග්‍රන්ථය වන මනෝරථපූරණී ග්‍රන්ථය එදා රෝම අකුරින් (ඉංග්‍රීසි) නොව සිංහල අකුරින් පමණක් තිබුණි. එය රෝම අකුරට හෙළුවෙ මෙතුමාය.
6. Pali Tripitaka Concordance පාලි ත්‍රිපිටක නාම මාලාව (ත්‍රිපිටක ග්‍රන්ථ රාශියෙහි පවත්නා පද එකතුවක් වන මෙය ලෝකයේ බොහෝ විද්වතුන් වෙත පැවරුණු කාර්යයක් වූයේය. නමුත් එහි යෙදුණේ වුඩ්වර්ඩ්තුමා පමණි අ සිට ඔ තෙක් පද

රැසක් එහි පළමු වෙළුම පලවුනේ 1956 දී, එතුමාගේ ඇවෑමෙන් සිව්වසරකට පසුය. වුඩ්වර්ඩ්තුමාගේ ශ්‍රේෂ්ඨතම කෘතිය මෙයයි.

7. The Manual of a Mystic නම් කුඩා ග්‍රන්ථයක් ද පළ කළේය.

විදෙයාදය විද්‍යලංකාර පිරිවෙණ් දෙකින් විදේශීය ශිෂ්‍යයෝ විශාල ප්‍රමාණයක් ධර්ම ශාස්ත්‍රය හදාළහ. 1873 හා 1875 වර්ෂයන්හි විදෙ‍ය්දය විද්‍යාලංකාර පිරිවෙන් දෙකින් අධ්‍යාපනය ලැබූ විදේශීය ශිෂ්‍යයෝ බොහෝ ගණනක් බුදු දහම තම තමන්ගේ රටවල ව්‍යාප්ත කිරීමට මහඟු සේවයක් කළහ. **ඒ පිළිබඳව ‘මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන” ග්‍රන්ථයේ 75 පිටේද** ‘‘පූජිත ජීවිත’’ පළමු වෙළුම 27 පිටේද ඉදිරිපත් කර ඇත. **එහි නම් 12 ක්** වේ.[17]

| | | | |
|---|---|---|---|
| i. | කෝපින් ගුණරත්න | ii. | කොපිමා කෝණ්ඩඤ්ඤ |
| iii. | සතො | iv. | නව්ධානා |
| v. | කොසමහක ධම්මානන්ද | vi. | සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ |
| vii. | ඥානානන්ද භික්ෂුව | viii. | බෙවරදුස |
| ix. | හරගෝවින්ද | x. | ඇන් කේ භගවාන් |
| xi. | ද්‍රවිඩ ජාතික විමලබුද්ධි භික්ෂුව | xii. | වට්ටිගම පුඤ්ඤානන්ද භික්ෂුව |

මොවුනතුරින් තව්බානා විද්‍යෝදයෙන් ඉගෙන ජපන් රටට ගොස් ‘‘ඔසාකා’’ විශ්වවිද්‍යාලයේ පාලි මහාචාර්ය ධුරය දැරීය. සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ පඬිතුමා කල්කටා සංස්කෘත මහා විද්‍යාලයේ සංස්කෘත මහාචාර්යවරයාය. හරගෝවින්ද මහතා කල්කටා විශ්ව විද්‍යාලයේ ප්‍රකෘතභාෂා පිළිබඳ ආචාර්ය ධුරයක් හා ඒ පිළිබඳ විශේෂ පරීක්ෂක ධුරයක් ද දැරීය. වට්ටිගම පුඤ්ඤානන්ද හිමි ද කල්කටා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් විය. එම නිසා මෙම විදෙ‍ය්දය පිරිවෙණෙන් බිහි කළ විදේශීය ශිෂ්‍යයන්ගෙන් බුදු දහම හා පාලි ධර්මය ජාත්‍යන්තර මට්ටමට ගෙන යෑමට දුන් දායකත්වය ඉමහත් බව සඳහන් කළ හැකිය.

මේ ආදී වශයෙන් බටහිර උගතුන් විසින් පාලි හා බෞද්ධ අධ්‍යයනයට සම්බන්ධව දක්වන ලද සුවිශේෂී උනන්දුව හා කැප කිරීම විශේෂයෙන්ම ඔවුන්ගෙන් සිදු වූ ශාස්ත්‍රීය දායකත්වය ථෙරවාද බුදු දහම යුරෝපයේ ප්‍රචලිත වීමට අතිශයින්ම උපකාර වූ බව පෙන්වා දිය හැකිය.

බුදු දහම මෑත යුගයේ ජාත්‍යන්තරකරණයට බල පෑ තවත් ප්‍රබල සාධකයක් වශයෙන් දැක්විය හැක්කේ 1891 අනාගාරික ධර්මපාල තුමා විසින් ස්ථාපිත කරන ලද මහාබෝධි සමාගම හා ඉන් සිදු වූ සේවයයි. කිසිදු ආත්මාර්ථකාමි පටු චේතනාවකින් තොරව පරම පවිත්‍ර පරමාධ්‍යාශයකින් ආරම්භ කරන ලද මෙම මහා බෝධි සමාගම ජාතික හා ආගමික වශයෙන් ශ්‍රී ලංකාව තුළ ඇති කළ පුනරුදය ශ්‍රී ලාංකේය බුදු දහමේ ආරක්ෂාව හා වර්ධනයට උපස්ථම්භක විය. මෙම සමාගම මගින් සිදු කළ විශාලතම සේවය නම් බුදු දහම උපන් දේශය වන ඉන්දියාවේ නැවත බුදු සමය පුනරුත්ථාපනය කිරීමයි. හින්දු මතධාරී

මහන්තාගෙන් බුද්ධගයාව බේරා ගැනීම බෞද්ධ ලෝකයාට කළ අතිමහත්ම සේවය වශයෙන් සඳහන් කළ හැකිය.

2. බුදු දහම ඉන්දියාව තුළ නැවත පුනරුත්ථාපනය කිරීම නිසා ආචාර්ය අම්බෙඩ්කාර්තුමා ප්‍රධාන ලක්ෂ ගණනක් බෞද්ධ වූහ. ඉන්දියාව තුළත් ලෝකයේ විවිධ රටවලත් මහාබෝධි සමාගම් ශාඛා පිහිටුවීම ලොව පුරා බුදු දහම ව්‍යාප්ත කිරීමට මහඟු දායාදයක් වූ බව පෙන්වා දිය හැකිය.බෞද්ධයන්ගේ මුදුන් මල් කඩක් බඳු ශ්‍රී මහාබෝධි වෘක්ෂයේ ශාඛාවන් ඒ ඒ රටවල පිහිටුවමින් බුදු දහම ජාත්‍යන්තරව ස්ථාපනය කිරීමට මෙම මහාබෝධි සමාගම් විසින් කටයුතු කරන ලදි.

3. නූතන ලෝකයට බුදු දහම හඳුන්වා දීමට නැගෙනහිර හා බටහිර බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් සිදු වූ සේවය අප්‍රමාණයි. මහා බ්‍රිතාන්‍යයේ බිහි වූ ආනන්ද මෙත්තෙය්‍ය (Allan Bennet) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබා මහ බ්‍රිතාන්‍යය තුළ බුදු දහම ප්‍රචලිත කිරීමට ඉමහත් කැපවීමක් කළ භික්ෂුවකි. ජාත්‍යන්තර කීර්තියට ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේලා රාශියක් බුදු සමය ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූහ.

උන්වහන්සේලා අතර නාරද, පියදස්සි, කිරින්දේ ධම්මානන්ද, හම්මලවල සද්ධාතිස්ස බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය, යනාදි දැන උගත් ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා ප්‍රධාන වෙති. ධර්ම දේශනා කිරීම, පිරිත් කීම, පොත්පත් රචනා කිරීම විවිධ ආගමික හා ශාස්ත්‍රීය කටයුතු මගින් බටහිර ජනතාවට ධර්ම රසඥතාව ජනිත කරවූවා පමණක් නොව ථේරවාද විහාරස්ථාන රාශියක් යුරෝපය පුරා බිහි කිරීමට හැකියාව ලැබුණි.

4. බෞද්ධයන්ගේ දේශාන්තර සංක්‍රමණ බුදු දහමේ ජාත්‍යන්තර ව්‍යාප්තියට තුඩුදුන් තවත් ප්‍රබල සාධකයක් වශයෙන් පෙන්වා දිය හැකිය. දේශපාලන කැරළිකෝලාහල හා යුද්ධමය පසුබිම යටතේ ජනතාව ඒ ඒ රටවල් අතහැර වෙනත් රාජ්‍යයන්ට සංක්‍රමණය වීමේ දී තම සංස්කෘතික ආගමික විශ්වාසයන්ද රැගෙන යති. ඒ අනුව 1949 චීනයේ අභ්‍යන්තර කරුලිකෝලහාල ද 1959 ටිබෙටයේ යුධමය වාතාවරණය ද, 1970 දශකයේ වියට්නාම් කාම්බෝජ හා ලාඕස් යන බෞද්ධ රාජ්‍යයන්හි සිදු වූ අභ්‍යන්තර දේශපාලන හා යුධමය නොසන්සුන්තාවන් ද විශාල වශයෙන් බෞද්ධයෝ තම උපන් භූමින් අතහැර යුරෝපීය රටවලට සංක්‍රමණය වීමට හේතු විය. එකී සාංක්‍රමණික ජනතාව අතරට බෞද්ධ භික්ෂූන් ද අයත් වීම නිසා ඒ ඒ ප්‍රදේශවල බෞද්ධාගමික සිද්ධස්ථාන ඉදි කර ගන්නා ලදි. දලයි ලාමාතුමා ඉන්දියාවට පැමිණ පදිංචි වීමෙන් වර්තමාන ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල ටිබෙට් බුදු සමය මුල් බැස ගෙන තිබෙන ආකාරය මැනවින් දැක ගත හැකිය. නේපාලයේ කත්මණ්ඩු නගරය අවට කඳුවැටිවල ගුරු පැහැතින් ඉදිකර තිබෙන ලාමා පන්සල් නේපාලයට ටිබෙට් බුදු දහමේ බලපෑම කෙතරම් දැයි සිතා ගත හැකිය. චීන-ටිබෙට් ගැටුම නිසා දලයි ලාමාට හා ටිබෙට් බුදු සමයට යුරෝපය පුරා හිමි වී තිබෙන ඉඩකඩ අතිවිශාලය. කොස්මා ඩි කොරොස් හා වෙඩිල් වැනි අයගේ පර්යේෂණ කෘති මගින් පමණක් ටිබෙට් බුදු සමය යනු හුදෙක් වජ්‍රයානා හෝ තන්ත්‍රයානා වශයෙන් හඳුනා ගෙන සිටි යුරෝපියන්ට මෙම ජන

සංක්‍රමණයන් සමග ටිබෙට් බුදු සමයේ සුන්දරත්වය හා ආධ්‍යාත්මික වටිනාකම විඳ ගැනීමට වාසනාව ලැබුණි. එසේම, වියට්නාම් විහාරස්ථාන ඇමෙරිකාව කැනඩාව යනාදි රටවල ව්‍යාප්ත වීමට වියට්නාම් ඇමෙරිකා යුද්ධය බලපාන්නට ඇති බව කල්පනා කළ හැකිය.

ජපානයට පමණක් සීමා වී තිබුණු සෙන් බුදු දහම යුරෝපයට හඳුන්වා දෙනු ලැබුයේ ජපන් ජාතික ඩී ටී සුසුකි නම් අද්විතීය විද්වතා විසිනි. 1883 බුන්යූ නන්ජියෝ විසින් සකස් කරන ලද චීන ත්‍රිපිටක ග්‍රන්ථ නාමාවලිය (Catalogue of the Chinese Tripitake) චීන බෞද්ධ අධ්‍යයන ප්‍රචලිත වීමට පිටුවහලක් විය.

5. එකම භික්ෂු ශාසනය දෙවන සංගයානාවෙන් පසු විවිධ වූ දාර්ශනික හා සම්ප්‍රදායයන් ඔස්සේ බෙදී වෙන් වී යන ආකාරය ක්‍රිස්තු වර්ෂය ආරම්භයට පෙර සිටම දැක ගත හැකිය. එය ක්‍රිස්තු වර්ෂ 1වන සියවසේ පමණ සිව්වන සංගායනාවෙන් පසු පැහැදිලි ලෙසට මහායාන හා හීනයාන වශයෙන් ප්‍රධාන ප්‍රවාහයන් දෙකකට බෙදී වෙන් වී ගියේය. නිර්වාණය අරමුණු කොට අර්හත් යානය පිළිගත් පිරිස හිනයාන ගණයටත් බුද්ධත්වය පරමාර්ථය කොට බෝධිසත්ව යානය පිළිගත් පිරිස මහායාන ගණයටත් අයත් විය. එකම ශාස්තෲන් වහන්සේගේ ශිෂ්‍යවරයන් වීම නිසා මෙම සම්ප්‍රදාය දෙකම බුදු දහමේ මූලික සිද්ධාන්ත අවිවාදයෙන් පිළිගනී. මෙම සම්ප්‍රදායන් දෙක අතර කොතරම් වාද විවාද හා නොගැලපීම් තිබුණත් ඒවා ආගමික යුද්ධ තෙක් වර්ධනය නොවිණි. ථේරවාද බුදු සමය දකුණු ආසියානු කලාපීය රටවල ඉතා හොඳින් ආධිපත්‍යය පතුරුවා ගත් අතර මහායාන බුදු සමය නැගෙනහිර ආසියානු රටවල්වල බලය හිමිකර ගනු ලැබුයේ මහායාන බුදු දහම මගිනි. මෙම සම්ප්‍රදාය දෙකෙහි සාමග්‍රිය බුදු සමය ආසියානු ජනතාවගේ සිතුම් පැතුම් හා ජීවිතය සකස් කරන ප්‍රධාන බලවේගය නොඅනුමානය. වර්තමානයේ මහායාන හිනයාන භේදයකින් තොරව බෞද්ධ රටවල් සාකච්ඡා සම්මන්ත්‍රණ හා ශිෂ්‍ය හුවමාරු ක්‍රමාදිය තුළින් ඒකරාශී වෙමින් අගය කළ යුත්තකි. මේ සඳහා මූලිකත්වය ගත් අද්විතීය උගතෙකු වශයෙන් ජී පී මලලසේකර මහතා සඳහන් කළ හැකිය. එතුමා විසින් 1950 (The World Fellowship of Buddhists) ථේරවාද හා මහායාන රටවල් විස්සකට අධික සංඛ්‍යාවක් සහභාගිත්වයෙන් නුවර දළදා මාලිගාවේදී පවත්වන ලද මහා බෞද්ධ සම්මේලනය ථේරවාද මහායාන බෞද්ධ සම්ප්‍රදාය දෙකෙහි සාමග්‍රියට මෙන්ම නූතන ලෝකයට බුදු සමය ව්‍යාප්ත කරවීමට හේතු භූත වූ වැදගත් සාධකයක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම මහා බෞද්ධ සම්මේලනයට සමගාමී ලෙස තවත් බොහෝ බෞද්ධ සංවිධාන පිහිටුවා ගන්නා ලදි. ඒ අතර, ලෝක බෞද්ධ සංඝ සම්මේලනය (World Buddhist Sangha Council) සක්‍රිය දායකත්වයක් දරණ බව පෙන්වා දිය හැකිය.

6. ඉහත සඳහන් කළ හේතු සාධක හැරුණු විට බුදු සමය ජාත්‍යන්තරකරණයට තුඩු දුන් තවත් හේතු කාරක රාශියක් විද්‍යමාන බව පැවසිය හැක. ඒ අතර තාක්ෂණික දියුණුව ගමනාගමන පහසුව, ගෝලීයකරණය ඒ ඒ රටවල්වල ප්‍රජාතන්ත්‍රවාදි නිදහස් චින්තනයත්,

දේවවාදයෙන් හෙම්බත්වීමාදි කාරණා රාශියක් මෙම බෞද්ධ දර්ශනය වෙත ඇදී ඒමට යුරෝපීය ජනතාව පෙළඹූ බව ඉතා සියුම් ව පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නකි.

එසේම, ස්වභාවික විපත් යුධ කෝලාහාල, කාර්ය බහුලත්වය, ආතතිය, ආර්ථික හීනතාවයන් හා නොයෙකුත් භයානක ලෙඩ රෝගාදිය ද එක්තරා මට්ටමකට මිනිසා ආගම දහමට යොමු කරවන සාධක වශයෙන් දැක්විය හැකිය. බුදු දහමේ ආගමික සැනසිල්ල සමහර විට විදේශිය ජනතාවට යම් ආශිර්වාදයක් හෝ සහනයක් ලබා දීමට සමත් වුවාට සැක නැත. එසේම, මෑත යුගයේ ලෝකයේ ඉතා ජනප්‍රියව ප්‍රචලිත වූ මනෝවිද්‍යාත්මක පර්යේෂණ හා සම්බන්ධ කෘති පල වීම නිසා බුදු දහමේ පුනර්භවය, කර්මය වැනි සංකල්ප පිළිබඳ විශ්වසනීය අර්ථකථනයන් බිහි වීම යුරෝපීය ශාස්ත්‍රඥයන් ආකර්ෂණය කර ගැනීමටත් ආගමික සහනය සොයන්නවුන්ගේ විශ්වසනීයත්වය වර්ධනය වීමටත් හේතු වන්නට ඇත. එඩ්ගාර් කේෂි, ඇලන් වැම්බො, මිනා ෂර්මිනා යනාදි බොහෝ බටහිර මනෝ විද්‍යාඥයන්ගේන් සිදු වූ සේවය අප්‍රමාණය.

7. බුදු දහම නූතන ගෝලීය ලෝකයට දායාද කරවීමේ දි ඉහත සඳහන් කළ බාහිර සාධක මෙන්ම බුදු දහම තුළම පවතින අවියෝජනීය කුශලතාව ද බල පෑ බව අප විසින් අමතක නොකළ යුතුය. බුදු දහම යනු පරිපූර්ණ දර්ශනයකින් හෙබි අනභිභවනීය සංස්කෘතියක් හිමි කරගත් ඉගැන්වීම් සමුදායකි.

බුදු දහම 'දර්ශනයකි' 'ජීවන ප්‍රතිපදාවකි' 'ආගමකි' යනාදි විවිධ අදහස් බුදු දහම සම්බන්ධයෙන් පළ වී තිබුණත් බුදු දහම සුවිශේෂී වන්නේ මේ සියලු ලක්ෂණයන් එහි දර්ශනය හා සංස්කෘතිය තුළ ගැබ්ව ඇති නිසාය. සාමාන්‍යයෙන් ලෝක ජනතාව අංශ තුනකට වර්ග කර ගත හැකිය. එනම් බුද්ධිමය රසඥතාවක් ඇති දාර්ශනික චින්තාවක් අගය කරන ගැඹුරු වින්දනයක් අපේක්ෂා කරන විදග්ධ ජනතාව හා ශ්‍රද්ධාව හා භක්තිය අධික කොටගත් හුදු ආගමික විශ්වාස හා විමර්ශන මගින් ජීවිත තෘප්තිය ලබන සැහැල්ලු මානසිකත්වය සහිත ජනතාව හා ප්‍රායෝගික අත්හදා බැලීම් තුළින් ආධ්‍යාත්මික හා භෞතික විමුක්තිය සොයන ජනතාව වශයෙනි. මේ උභයවර්ගී සහෘද ජනතාවම ආකර්ෂණය කර ගැනීමට තරම් ශක්තිමත් දහමක් වශයෙන් බුදු සමය පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලාංකේය බුදු දහම ශාස්ත්‍රීය වශයෙන් ථේරවාදි බෞද්ධ රටවල් තිබෙන, අද්විතිය ස්ථානය ප්‍රශංසනීයයි. ලංකාවේ සෑම ප්‍රධාන විශ්ව විද්‍යාලයකට පාහේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයක් බිහි වූ අතර එමගින් ශ්‍රී ලාංකේය බෞද්ධ ශාස්ත්‍රීය අධ්‍යයනයක් පුලුල් වී ගිය බව ප්‍රකාශ කළ හැකිය. මේ නිසා වර්තමානයේ වුව ද ශ්‍රී ලංකාව සුවිශේෂී වන්නේ ථේරවාදි බුදු දහම පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයන මධ්‍යස්ථානයක් වශයෙනි.

තායිලන්තය, බුරුමය මෙන්ම ශ්‍රී ලාංකේය ථේරවාදි විපස්සනා භාවනා ද ඉතා ජනප්‍රිය ක්‍රමවේදයක් වශයෙන් පෙන්වා දිය හැකිය. බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය, ඊරුකානේ

චන්දපිටල වැනි තාපෝවෘද්ධ ගුණවෘද්ධ මහතෙරුන් වහන්සේලා ප්‍රායෝගිකව අත්හදා බැලීමට දැරූ ප්‍රයත්නය ඉමහත්ය. වර්තමානයේ යුරෝපයේ වුවද ථේරවාදී බෞද්ධ ක්‍රමයට අගනා ඉල්ලුමක් තිබෙන බව දක්නට ලැබේ.

ථේරවාදී ආගමික පුද පූජා අංගය සාමාන්‍ය හුදු මානසික සැනසිල්ලක් සොයන ජනතාව උදෙසාය. එය බහුල වශයෙන් පදනම් වී තිබෙන්නේ පුද පූජා හා ආගමික අභිචාර මතය. ඒවා අතර බෝධි පූජා, බුද්ධ පූජා හා පිරිත් සජ්ඣායනය සුවිශේෂී වේ. මෙබදු චර්යාවන් තුළින් මනෝචිකිත්සක (psycho therophy) ක්‍රමවේදයක් සිද්ධ වන බවත් ඒ තුළින් විශාල මානසික සුවයක් අනුගාමිකයන් අත්විඳින බවත් පෙන්වා දිය හැකිය. මේ නිසා ථේරවාදී බුදු සමය සතු ත්‍රෛවර්ගී අංගයන් ශක්තිමත් කර ලොවට දායාද කිරීම ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාවගේ කාලීන වගකීමක් බව පෙන්වා දිය හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


1.*මහා වග්ගපාලි,* I, නිදානය, 42 පි, බුද්ධ ජයන්ති සංස්කරණය කොළඹ 1957. "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය දෙවමනුස්සානං"

2.*දීඝනිකාය,* 3, 288 පි, "සිගාලෝවාද සූත්‍රය," බුද්ධ ජයන්ති සංස්කරණය කොළඹ, 1958 "උභෝ ලොකො විජයාය පටිපනෙනා"

3. *දීඝනිකාය,* 3, 306 පි, "ජනවසභ සූත්‍රය," බුද්ධ ජයන්ති සංස්කරණය කොළඹ,1958

4. Gombridge, H.B. *The World of Buddhism*, p 99 -193 Thomas and Hudson, Ltd, London, 1991

5. ධම්මජෝති හිමි, "බුදු දහම චීන සංස්කෘතිය තුළ හිමිකර ගත් ස්ථානය පිළිබඳ ඓතිහාසික හා දාර්ශනික විමසුමක්" *අන්වේෂණ,* 79 පි, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්ව විද්‍යාලය, 2007

6. Zhen Shan, *A History of Development of Tibet'*, P Foreign Language Press, Beijing, 2001

7.Bapat, B, P, *2500 years of Buddhism*, p 383, Government of India, India, බුද්ධ වර්ෂ 2500

8. බලන්න, පී. හේවාවසම්ගේ, *මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන,* 75 පි

9. *පූජිත ජීවිත,* පළමු වෙළුම 27 පි, අධ්‍යාපන සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි. 1990


9

17